# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2392/47 - 2024 ජූලි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2024.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. බී. 4833 දරන සහ මාහේන්වත්ත, පිටිපන, හෝමාගම යන ස්ථානයේ පිහිටි උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2024 මැයි මස 08 දින අංක 2383/28 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "අධ්‍යාපන කළමනාකරණය සහ නායකත්වය පිළිබඳ අධ්‍යාපනපති" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 30 ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 09 වන ස්ථරයේ) තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය හා අවම අධ්‍යයන සම්භාර 60 ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 10 වන ස්ථරයේ) තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය සම්බන්ධයෙන්,

   (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් ගෞරව උපාධියක් සමග පශ්චාත් අධ්‍යයන මණ්ඩලය විසින් පිළිගත් අවම වශයෙන් වසරක සුදුසු සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ;

   (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් උපාධියක් සමග පශ්චාත් අධ්‍යයන මණ්ඩලය විසින් පිළිගත් අවම වශයෙන් වසර දෙකක සුදුසු සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ;


1A - PG 6765 — 284 (2024/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන SLQF අටවන ස්ථරය සඳහා නිර්ණායක සපුරාලන පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සමග පශ්චාත් අධ්‍යයන මණ්ඩලය විසින් පිළිගත් අවම වශයෙන් වසර දෙකක සුදුසු සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ;

(ඈ) පශ්චාත් උපාධිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම වෘත්තීය සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය | එම්අයිටී |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | එම්එස්සී (අයි ටී) |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2024 ජූලි මස 04 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 - 0104